සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **නර්තනය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

**සැලකිය යුතුයි ඃ**

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

- **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචනය තෝරන්න.**

01. පා සරඹ අභ්‍යාස කිරීමේදී යොදාගන්නා සණ වාද්‍ය භාණ්ඩය වන්නේ .......................... ය.

(1) ගැටබෙරය (2) පන්තේරුව (3) තාලම්පට (4) උඩැක්කිය

02. 'වකරෙට ගැසූ සුළඟින් එනැව බිඳී සමුදුර මැද ගිලුනෙත්' ....... මෙම කවි පදය අයත් වන්නේ .......................... නැටුමටයි.

(1) රබන් (2) ගොයම් (3) ලී කෙළි (4) කුළු

03. කොහොඹ කළය සහ කාවඩි නැටුම් වඩාත් දැකිය හැක්කේ ..................... පෙරහැරේදීය.

(1) මිහිඳු (2) වේල් (3) සංඝමිත්තා (4) දුරුතු

04. අඹුම් කවි හා හිං හතරේ කවි ගායනා කරනු ලබන්නේ .................. ශාන්තිකර්මයේදීය.

(1) කොහොඹා කංකාරිය (2) දෙවොල්මඩුව
(3) මලියක් මංගල්‍යය (4) බලි

05. කඳවුරු සිරිත සහ සද්ධර්ම රත්නාවලිය කෘති ........... යුගයේ නර්තන කලාව පිළිබඳ මූලාශ්‍රය වේ.

(1) මහනුවර (2) කෝට්ටේ (3) දඹදෙණිය (4) ගම්පොළ

06. රන් ආලේපකරන ලද කුලුණුවලින් හා චීන පටසළුවලින් අලංකාර කරන ලද .............. නැටුම් ගැයුම් සඳහා ඉදි වූවකි.

(1) නිශ්ශංක ලතා මණ්ඩපය (2) සරස්වතී මණ්ඩපය
(3) රන්කොත් මණ්ඩපය (4) කවිකාර මණ්ඩපය

07. පණිවිඩ කෝලම් හා සබ නැටුම් ඇතුලත්වන ගැමි නාටකයකි. ...............

(1) සොකරි (2) කෝලම් (3) නාඩගම් (4) නූර්ති

08. ශාන්ත රසය හා අද්භූත රසයෙන් ජනිතවන භාවයන් පිළිවෙලින් ..............

(1) විශ්මය හා ශම (ශාන්ත) (2) ශම (ශාන්ත) හා උත්සාහ
(3) ශම (ශාන්ත) හා විශ්මය (4) විශ්මය හා භය

09. දැතට ගෙන කණුවක් වටේ රටාමවමින් නටන ද්‍රවිඩ ගැමි නැටුම .................... වේ.

(1) කෝලාට්ටම් (2) කාවඩි
(3) පින්නල් කෝලාට්ටම් (4) කරගම්

10. බෙරපද කවිපද ආදියට අදාළ තාලය දැක්වීමට ............. නම් වේ.

(1) ප්‍රස්ථාරකරණය (2) ප්‍රශ්නකරණය (3) ප්‍රකාශකරණය (4) වාර්තාකරණය

11. මෙම රූපයෙන් දැක්වෙන්නේ නර්තන කලාව පිළිබඳ පර්යේෂණ කෘති රචනා කළ ශිල්පියෙකි. ඔහුගේ නම සහ රචනා කළ කෘතියක් වන්නේ,



(1) තිස්සකාරියවසම් - ශාන්තිකර්ම හා සිංහල සමාජය

(2) ජේ. ඊ. සේදරමන් - උඩරට නැටුම් කලාව

(3) මුදියන්සේ දිසානායක - සිංහල නර්තන කලාව

(4) ජයසේන කෝට්ටේගොඩ - කිරිමඩු ශාන්තිකර්මය.

12. 'ජීවිතයත් මුහුද වගේ - ඉමක් නැතේ කොනක් නැතේ' මෙම ගීතය ඇතුලත් මුද්‍රා නාට්‍ය වන්නේ,

(1) නලදමයන්ති (2) කරදිය (3) කුමි කතාව (4) ග්‍රහ අපලය

13. ගැටබෙරයේ වම් හා දකුණු ඇස් බෙරයට සම්බන්ධ කර ඇත්තේ,

(1) කැපුම් හමෙනි. (2) වෙනිවර කැරැල්ලෙනි.

(3) වරපටවලිනි. (4) ඉල්ලම්වලිනි.

14. දෙවොල්මඩුවට අයත් චාරිත්‍ර විදියකි.

(1) වැදියකුන් නැටීම. (2) හඟලේ යැදීම.

(3) මිල්ල කැපීම. (4) අයිලේ යැදීම.

15. 'ගුම් දැහිමි ගුද ගුද දැහිමි' යන බෙරපදයට අනු සභාවට පැමිණෙන කෝලම් චරිතය වන්නේ,

(1) ලෙංචිනා (2) ආරච්චිලා (3) අණබෙර (4) ජසයා

16. ආහාර්ය අභිනයේ ප්‍රධාන අංග දෙකකි.

(1) අංග රචනය හා රංග රචනය (2) රංග රචනය හා වෙස් මෝස්තර රචනය

(3) අංග රචනය හා වෙස් මෝස්තර රචනය (4) අංග රචනය හා සැරසිලි

17. මලබෙර වාදනය සඳහා මුල් කාලයේදී යොදගත් වාද්‍ය භාණ්ඩය වනුයේ,

(1) පටහ බෙරය (2) පොකුරු බෙරය (3) ලෝහ බෙරය (4) සෝෂක බෙරය

18. දළදා වහන්සේ මාලිගාව ඇතුලට වැඩමවීමේදී මෙම හේවිසි වාදනය කරනු ලබයි.

(1) අඹරා හේවිසි (2) අලුයම් දූරය (3) හැන්දෑ ධූරය (4) ගෙවැදුම් හේවිසි

19. ජේ. ඊ. සේදරමන් මහතා විසින් වන්නම් පිළිබඳ රචනාකර ඇති ග්‍රන්ථයකි.

(1) නෙර්තමාලය (2) වාදාං කුස රත්නමාලය

(3) නෘත්‍යවිනෝද (4) නෘත්‍යරත්නාකරය.

20. රවින්ද්‍රනාත්තාගෝර් තුමාගේ පැමිණීමත් සමඟ නර්තන කලාවේ නව ප්‍රබෝධයක් ඇති වූ වර්ෂය ලෙස සැලකෙන්නේ,

(1) 1936 (2) 1934 (3) 1933 (4) 1952

21. නළුගීතිකා තාලය හා කොවුලා වන්නම අයත් වන නර්තන සම්ප්‍රධායන් දෙක වන්නේ,

(1) උඩරට සහ පහතරට (2) පහතරට සහ උඩරට

(3) පහතරට සහ සබරගමු (4) සබරගමු සහ උඩරට

22. කෙනෙකුගේ බාහිර ස්වරූපය ඒ අයුරින්ම ඉදිරිපත් කරන අංගරචනය වන්නේ,

(1) චරිතාංග අංගරචනය (2) ශෛලිගත අංගරචනය

(3) විකාරරූපී අංගරචනය (4) ස්වාභාවික අංගරචනය

23. ආඝාතාත්මක සහ අනාඝාතාත්මක ගතිලක්ෂණ ඇතුලත් නාට්‍ය ගීතයකි.

(1) ඇහැල මලින් ගස් පිරිලා... (2) වාසනා දිනේකි මේක ....

(3) හනික වරෙව් කොල්ලනේ... (4) මෙම ගිම්හාන

24. පත්තිනි දෙවියන් හා කතරගම දෙවියන් පුද ලබන ගැමි නාටකයකි.

(1) නාඩගම් (2) කෝලම් (3) සොකරි (4) රූකඩ

25. මහල්ලෙක් හැරමිටියක් ඇතැතිව අපහසුවෙන් ගමන් කරයි. සතර අභිනය විග්‍රහ කිරීමේදී පාඨයේ ඇතුළත් හැරමිටිය අයත් වන්නේ,

(1) රංග භාණ්ඩවලටය. (2) ඇඳුම් පැළඳුම්වලටය.

(3) වේෂ නිරූපණයටය. (4) අංග රචනයටය.

| | 1 | 2 | 3 |
|---|---|---|---|
| A | රිෂ්ම්පුරිටි | කුප්පායම් | පොශ්වාන් |
| B | පෙනා | ඉලතාලම් | තාල |
| C | ශාන්තිනිකේතනය | කේරලකලාමණ්ඩලම් | කලා ක්ෂේත්‍රම් |
| D | කේලි කුත්තු | පරන් | පරේංග් |

26. මනිපුරි හා කතකලි නර්තනයේ උඩුකයට අඳිනු ලබන ඇඳුම් කොටස් සඳහන් වන්නේ,

(1) A - 1 හා 3 තීරුවේය. (2) A - 1 හා 2 තීරුවේය.

(3) B - 1 හා 3 තීරුවේය. (4) B - 2 හා 3 තීරුවේය.

27. මනිපුරි නර්තනය සඳහා වාදනය කරනු ලබන තාල වාද්‍ය භාණ්ඩය ඇතුලත් වන්නේ,


(1) B - 1 තීරුවේය. (2) B - 2 තීරුවේය.

(3) B - 3 තීරුවේය. (4) D - 3 තීරුවේය.

28. ශිව පාර්වතී රාධා ක්‍රිෂ්ණා කථා පුවත් පසුබිම් කොටගෙන ආරම්භ වූ නර්තන සම්ප්‍රධාය උගන්වනු ලබන ආයතනය වන්නේ,

(1) C - 2 තීරුවේය. (2) C - 3 තීරුවේය.

(3) C - 1 තීරුවේය. (4) C - 1. 2 තීරුවේය.




29. ඉහත සඳහන් A, B, C රූප සටහන්වලින් දැක්වෙන රංගාභරණ වන්නේ,

(1) උරබාහු, හැඩකැල්ල, නලල්තැල්ල (2) නලල් තැල්ල, හැඩකැල්ල, ඉනහැඩය

(3) ඉනහැඩය, බණ්ඩි වලලු, නලල්තැත්ල (4) උරබාහු, නලල් තැල්ල, හැඩකැල්ල

30. A, C රූපවලින් දැක්වෙන රංගාභරණයන් අයත්වන නර්තන සම්ප්‍රදායක් වන්නේ,

(1) උඩරට හා පහතරට (2) උඩරට හා සබරගමු

(3) පහතරට හා සබරගමු (4) සබරගමු හා උඩරට

31. මාත්‍රා $2+4$ තිත් රූපයට අයත් බෙරපදයකි.

(1) දොංජිජිගත (2) දොංජිංත ගත දොංත

(3) දොදොංත තකුදොම් (4) දොං දොංජිං ජිං ගජිගත

32. ගුරුගේ මාලාව නර්තනයට ගැනෙන රංගභාණ්ඩය වන්නේ,

(1) කොතලයයි (2) නැඹිලියයි

(3) පොල්මලයි (4) ඊගහයි

33. කොහොඹා කංකාරියට පමණක් අයත්වන චාරිත්‍ර විදියකි.

(1) කප් සිටුවීම (2) මිල්ල කැපීම

(3) හඟලේ යැදීම (4) මඩුපේ කිරීම.

34. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ සියලුම යක්දෙස්සන් සහභාගී වන ප්‍රථම හා දීර්ඝතම නර්තන අගංයකි.

(1) ආවැන්දුම (2) කෝල්පාඩුව (3) යක්තුන් පදය (4) යක් ඇන්නුම

35. තාං ජිංතත්තත්, ජිතත් ජිං තත්තත් ..... යන අඩව්වට අයත් තිත් රූපය වන්නේ,

(1) මාත්‍රා $2+3$ දෙතිතටය. (2) මාත්‍රා $2+4$ දෙතිතටය.

(3) මාත්‍රා $3+4$ දෙතිතටය. (4) මාත්‍රා $2+2+4$ තුන්තිතටය.

36. ' ගත්ත තෙහිගු තකට තකුද ' මෙම පද කොටස අයත් වන්නේ,

(1) කස්තිරමකටය. (2) අඩව්වකටය (3) සීරුමාරුවකටය (4) කලාසමකටය

37. උඩරට නර්තන සම්ප්‍රදායේ කාන්තාවන් උදෙසා කරනු ලබන ශාන්තිකර්මයකි.

(1) වලියක් මංගල්‍යය (2) කොහොඹා කංකාරිය

(3) කඩවර කංකාරිය (4) මල්මඩු ශාන්තිකර්මය

38. 'හැරත් මෙහෙම යස වැඩක් උගේ නැත.' යන කවිපද කොටස අයත් වන්නේ,

(1) තුරඟා වන්නමටය. (2) මුෂලඩි වන්නමටය.

(3) සැවුලා වන්නමටය. (4) සිංහරාජ වන්නමටය.

39. උඩරට නර්තන සම්ප්‍රධායට අයත් පාරිභාෂික වචන කීපයක් වන්නේ,

(1) කස්තිරම, සීරුමාරුව සහ ආවැන්දුම වේ.

(2) මණ්ඩිය, කස්තිරම සහ කලාසමවේ.

(3) පාසරඹ, වන්නම් සහ අඩව් වේ.

(4) සීරුමාරුව, පාසරඹ සහ ඉරට්ටිය වේ.

40. සෞන්දර්ය ආයතනයේ කථිකාචාර්ය වරයකු වශයෙන් උඩරට නර්තනය ඉගැන්වූ ප්‍රවීන ශිල්පියෙකි.

(1) කුලසිරි බුදවත්ත (2) කේ. එස්. ප්‍රනාන්දු

(3) ප්‍රේමකුමාර එපිටවෙල (4) අර්නෝලිස් ඉඹුල්ගොඩ

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **නර්තනය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකය: |
|---|

**සැලකිය යුතුයි :**
- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) සියළු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. වීරත්වය ප්‍රභල ලෙස විදහාපාන ගැමි නැටුමකි. ..............................................................................

ii. රස නිශ්පත්තියේදී මුල්වන ස්ථායිභාව ගණන .............................................................................. කි.

iii. මනිපුරි නර්තනයේදී දැතට පළඳිනු ලබන විශේෂය ................................................................. නම් වේ.

iv. භාරතීය සම්භාව්‍ය නර්තන කලාව .................................................................... මහතාගේ කෘතියකි.

v. මුල්ම ප්‍රශස්ත කාව්‍ය ලෙස පැළිගැනෙන්නේ .............................................................................. ය.

vi. උඩරට නර්තනයේ එන සබ නැටුමකි. ..............................................................................

vii. ටානියා, බැරකෝමා විසින් පිටපත රචනා කළ මුද්‍රා නාට්‍යයකි ..............................................................

viii. කළුකලි නර්තනයේ අනු ගායකයා ශිංකිඩි වන අතර ප්‍රධාන ගායකයා ............................................ නමින් හඳුන්වයි.

ix. භරත මුනිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව විස්තර වන නාට්‍ය ශෛලීන් 2 ක වන්නේ,

(අ) ................................................ (ආ) ............................................................

x. පහතරට නර්තන සම්ප්‍රදායේ 'ඉරට්ටිය' සමාන වන උඩරට හා සබරගමු නර්තන කොටස නම් කරන්න.

(අ) උඩරට ........................................... (ආ) සබරගමු ...............................................

(ල. 12)

(02) i. තුන්තිතේ තාලයට අයත් $(2+2+4)$ බෙරපදයක් ප්‍රස්තාර ගත කරන්න.

ii. 'අතකට ගෙන රබන් පොඩිය.....' යන රබන් කවියේ පාදයක් ප්‍රස්තාරගත කරන්න.

iii. සැවුලා වන්නමේ අඩව්ව ප්‍රස්තාරගත කරන්න.

(03) පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

i. ඊකා සීපද

ii. මළ බෙර වාදනය

iii. සතර බීජාක්ෂර

iv. කප් සිටුවීම

v. ත්‍රිවිධලය

(04) දේශීය ශාන්තිකර්ම වල පොදු ව්‍යුහයක් හා අන්තර්ගත සිද්ධීන්හි සම්බන්ධතාවක් දැකිය හැකිය.

i. ශාන්තිකර්ම වල එන පූර්ව චාරිත්‍ර 4 ක් නම් කරන්න.

ii. අස්නෙ, තෙල්මෙ සහ මල්පද යන නර්තන අංග අතුරෙන් එකක් පිළිබඳ විග්‍රහයක් කරන්න.


iii. කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව යන ශාන්ති කර්මවල එන පුරාවෘත්තිවලින් කියැවෙන සිද්ධිවල සමාන අසමානතා පිළිබඳ විමසුමට ලක් කරන්න.

(05) i. නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු අනාවරණය කරගත හැකි මූලාශ්‍ර 4 ක් නම් කරන්න.

ii. එක් එක් යුගවලදී නර්තන කලාව පැවති බවට වංශකථා ඇසුරෙන් සාධක දෙකක් ඉදිරිපත් කරන්න.

iii. විදේශිකයන්ගේ වාර්තාවක් ඇසුරෙන් සාධකයක් ඉදිරිපත් කරන්න.

(06) පහත දැක්වෙන්නේ භාරතීය නර්තන සම්ප්‍රදායන් දෙකකට අයත් වාද්‍ය භාණ්ඩ වේ.




i. A B රූපවලින් දැක්වෙන වාද්‍ය භාණ්ඩය අයත් භාරතීය නර්තන සම්ප්‍රදායන් නම් කර එම වාද්‍ය භාණ්ඩ දෙක නම් කරන්න.

ii. A වාද්‍ය භාණ්ඩය අයත් නර්තන සම්ප්‍රදාය පිළිබඳ විස්තරයක් කරන්න.

iii. C රූප සටහනේ වාද්‍ය භාණ්ඩ නම් කර එම නර්තන සම්ප්‍රදායට අයත් වේශ නිරූපණ ක්‍රම දෙකක් විස්තර කරන්න.

(07) i. අධ්‍යනන නර්තන නිර්මාණකරණය සඳහා අංග රචනය සහ ඇඳුම් පැළඳුම් නිර්මාණයේ දායකත්වය කෙසේ බලපා ඇත්දැයි විස්තර කරන්න.

ii. දේශීය නර්තන කලාවේ ප්‍රගමනයට ශ්‍රව්‍ය දෘශ්‍ය කලාවෙන් ලැබෙන පිටුවහල පිළිබඳ විස්තර කරන්න.

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 3 ) 02. ( 1 ) 03. ( 2 ) 04. ( 4 ) 05. ( 3 ) 06. ( 2 ) 07. ( 2 ) 08. ( 3 ) 09. ( 3 ) 10. ( 1 )
11. ( 3 ) 12. ( 2 ) 13. ( 3 ) 14. ( 3 ) 15. ( 4 ) 16. ( 3 ) 17. ( 1 ) 18. ( 4 ) 19. ( 4 ) 20. ( 2 )
21. ( 3 ) 22. ( 4 ) 23. ( 2 ) 24. ( 3 ) 25. ( 1 ) 26. ( 2 ) 27. ( 3 ) 28. ( 3 ) 29. ( 4 ) 30. ( 2 )
31. ( 4 ) 32. ( 2 ) 33. ( 3 ) 34. ( 4 ) 35. ( 1 ) 36. ( 2 ) 37. ( 3 ) 38. ( 4 ) 39. ( 1 ) 40. ( 4 )

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. කඩු ii. 9 iii. කුදොස් iv. ජයසේන කෝට්ටගොඩ
v. පැරකුම්බා සිරිත vi. පන්තේරු vii. කුඹි කථාව
viii. පොන්නානි ix. (අ) නාට්‍යධර්මී (ආ) ලෝකධර්මී
x. (අ) කස්තිරම (ආ) කලාසම (ලකුණු 12)

02. (i)

| 1̂ | 2 | 1̂ | 2 | 1́ | 2 | 3 | 4 | 1̂ | 2 | 1̂ | 2 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කු | ද | ග | ත | ග | ත | දොම් | - | කු | ද | ග | ත | ග | ත | දොම් | - |
| + | + | + | + | කු | දන් | - | ත | ග | ත | දොං | - | කු | දන් | - | ත |
| ග | ත | දොං | | | | | | | | | | | | | |

විභාගකර දැක්වීම හා සංකේත සඳහා - ල. 02
ප්‍රස්තාර කිරීමට - ල. 02

(ii)

| 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | අත | ක | ට | ගෙ | න | ර | බන් | - | පො | ඩි | ය |
| + | වය | ති | දි | සි | රු | වින් | - | - | - | - | - |

(ලකුණු 2x2=4)

(iii)

| 1̂ | 2 | 1́ | 2 | 3 | 4 | 1̂ | 2 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජෙං | - | තත් | - | තත් | - | ජෙං | - | තත් | - | තත් | - |
| ජෙං | - | තත් | - | තත් | - | ජෙං | - | තා | - | - | - |
| ජෙ | නු | තත් | - | තත් | - | ජෙ | නු | තත් | - | තත් | - |
| ජෙ | නු | තත් | - | තත් | - | ජෙ | නු | තා | - | - | - |
| ජෙං | - | තත් | - | තත් | - | ජෙං | - | තා | - | - | - |
| ජෙ | නු | තත් | - | තත් | - | ජෙ | නු | තා | - | - | - |
| ජෙං | - | තා | - | - | - | ජෙ | නු | තා | - | - | - |
| දොහො | කඩ | තා | - | - | - | දොහො | කඩ | ග | ත | කු | ද |
| දොහො | කඩ | තා | | | | | | | | | |

(ලකුණු 2x2=4)

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

(03) i. ♦ ආසාතාත්මක හා අනාසාතාත්මක ලක්ෂණ දෙක අන්තර්ගත බව ♦ පද මාලාවට අයත් වචන නොපිට පෙරළා කියන බව. ♦ හාස්‍ය හා උපහාසාත්මක ලක්‍ෂණ උත්පාදනය වන බව. ♦ කෙනෙකු මුහුණ පෑ හාස්‍යජනක අත්දැකීම් සිතෙහි ඇති අදහස් පරිසර විස්තර, සිද්ධි පාදකකොට රචනා වී ඇති බව. ♦ උදාහරණ ලෙස ටීකා සීපද ලියා තිබීම.

ii. ♦ අවමංගල්‍ය උත්සව සඳහා යොදාගන්නා බව. ♦ රජුගේ අභාවය සාමාන්‍ය ජනයාට දැනුම් දීමට හා නිලමෙවරුන්ට සහභාගීවීමට කරන අනක් ලෙස යොදා ගත්බව. ♦ මුල් කාලයේ දී පටහ බෙරය යොදාගත්බව හා පසු කාලයේදී දවුල හා තම්මැට්ටම යොදා ගැනීම. ♦ දවුල සුදු රෙද්දකින් වසා වාදනය කරන බව.

iii. ♦ අවනද්ධ භාණ්ඩ වාදනය කිරීමේදී ඉපදෙන මූලික අක්ෂර මේ නමින් හඳුන්වන බව. ♦ අක්‍ෂර නම් කොට, වාදනය කිරීමේ විධි ක්‍රම හඳුන්වා දී තිබේ නම්. ♦ ශිල්පීය දක්‍ෂතා සඳහා සතර බීජාක්‍ෂර පිළිබඳ අවබෝධය වැදගත් වන බව ♦ උදාහරණ සහිතව කස්තිරමක් / අඩව්වක් දක්වා තිබේ නම්.

iv. ♦ ශාන්තිකර්මය පැවැත්වීමට අපේක්ෂිත ස්ථානයේ කිරිගසකින් කපා ගත් කණුවක් සිටුවා බාරවීම සිදුවන බව. ♦ මෙය කප් කණුව ලෙසින්ද හඳුන්වන බව. ♦ කිරි ගසෙහි අත්ත ගොප් තෝඩු බැඳ සරසා පොල් මලක් හා පොල්ගෙඩි දෙකක් බැඳ දෙවියන්ට කන්නලව් කර චාරිත්‍රානුකූලව සිටුවන බව. ♦ කප් සිටුවා තුන් මසක් ඇතුලත අදාළ කටයුත්ත කරන බව.

v. ♦ තාලයේ වේගය ලය යනුවෙන් හඳුන්වන බව. ♦ විලම්භ, මධ්‍ය, දෘත වශයෙන් ත්‍රිවිධාකාර වන බව. ♦ සමගුණ, දෙගුණ, සිව්ගුණ වශයෙන් ද හැඳින්වෙන බව. ♦ ප්‍රස්තාර ගත කොට උදාහරණ දක්වා තිබේනම් (ල. 4x3 = 12)

(04) i. කප් සිටුවීම, මඩුපේ කිරීම, තොටපේ කිරීම, මිල්ල කැපීම.

ii. අස්නෙ

♦ කංකාරියට සහභාගීවන සියලුම යක්දෙස්සන් සහ බෙර වාදකයින් මෙම නර්තන අංගය සඳහා සහභාගී වන බව. ♦ ගායනය සහිත නර්තන අංගයක් බව. ♦ කොහොඹා කංකාරියේ පුරාවෘත්ති කතාවට සම්බන්ධයක් ඇතිබව. ♦ විවිධ තාල රූප මත පදනම් වී ඇති බව. ♦ ඊගසක් හා පොල් පන්දමක් රංග භාණ්ඩ ලෙස භාවිතා කරන බව.

තෙල්මෙ

♦ දෙවොල් මඩු ශාන්තිකර්මයේ ඉදිරිපත් කරන ශාස්ත්‍රීවූත් අලංකාරවූත් නර්තන අංගයක් බව. ♦ මල් පහන්, විලක්කු වලින් සරසන ලද තෙල්මෙ තටුව රඟමඩල මැද තබා සියළුම නර්තන ශිල්පීන් නර්තනයේ යෙදෙන බව. ♦ සාමූහික නර්තන අංගයක් බව. ♦ සාම්ප්‍රදායික තෙල්මෙ ඇඳුම් කට්ටලයෙන් සැරසී නර්තන ශිල්පීන්තම දක්ෂතා ඉදිරිපත් කරන අවස්ථාවක් බව.

මල්පද

♦ පහන් මඩු ශාන්ති කර්මයට අයත් නර්තන අංගයක් බව. ♦ පහන් මඩුවේ මල්මඩුපුරය හා සම්බන්ධබව. ♦ ගායනය සහිත නර්තන අංගයක් බව. ♦ මල් වරම් ගැසීම සුවිශේෂී කටයුත්තක් බව. ♦ තැඹිලි මල යොදා ගනිමින් ඉදිරිපත් කරන පෙළපාළි අංගයක් බව. (ල. 04)

iii. සමානතා

♦ රෝග නිවාරණය සඳහා යාගය පැවැත්වූ බව. ♦ වෛරය, ක්‍රෝධය, පළිගැනීම වැනි අවස්ථා

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

පිළිබිඹු වන බව ♦ රජවරුන් හා දෙවිවරුන් සම්බන්ධ වන බව.

අසමානතා

♦ කංකාරියේ පුද්ගල සාපකිරීම ප්‍රභලවන බව හා මඩුවල සත්ව පළිගැනීම නිසා සිදුවන බව. ♦ කොහොඹා කංකාරියේ පුරාවෘත්තයට කාන්තාවන් පසුබිම් වන බව. ♦ මඩු ශාන්ති කර්මවල සත්ව චරිතයක් මුල්කොට සිදුවන බව ♦ පුදලබන දෙවිවරු වෙනත් වන බව.

(05) i. ♦ වංශකථා ♦ සෙල්ලිපි ♦ රූකම් ♦ දේශසංචාරක වාර්තා ♦ සාහිත්‍යකෘති ♦ පුරාවෘත (ල. 04)

ii. මහාවංශය, දීපවංශය, ථූපවංශය, චූලවංශය ඇසුරින් සාධක 2 ක් ඉදිරිපත් කර ඇත්නම් ලකුණු දෙන්න. (ල. 04)

iii. ස්පිල් බර්ජන්, ඉබන්බතුතා, රොබට් නොක්ස් ආදීන්ගේ වාර්තා ඇසුරෙන් සාධකයක් ඉදිරිපත් කර ඇත්නම්. (ල. 04)

(06) i. A - මනිපුරි - පුංග් B - කථකලි - චෙන්ගිලම් (ල. 04)

ii. A - මනිපුරි නර්තන සම්ප්‍රදාය (ල. 04)

♦ උත්තර භාරතයේ ඇසැමයේ ප්‍රචලිත නර්තන සම්ප්‍රදායක්බව ♦ දේව විශ්වාස පදනම් කරගත් බව ♦ උත්තර භාරතීය සංගීතයමත නර්තන අංග ගොඩනැගී ඇතිබව ♦ රාස්ලීලා හා ලායිහරොබා ප්‍රධාන නර්තන අංග වන බව ♦ රාධා ක්‍රිෂ්ණා ප්‍රේමවෘත්තාන්ත ඇසුරෙන් නිර්මාණය වී ඇති බව ♦ පුංග්, මංජිරා බටනලා, පෙනා වාද්‍ය භාණ්ඩ වන බව ♦ කුම්මින්, රිෂම්පුරිම්, පොග්වාන් ...... වැනි ඇඳුම් වල විචිත්‍රවන දක් තිබීම. (ල. 04)

iii. කුම්භු

මිනිත්තු, පච්චා, කත්ති, තාඩි, කාරි, ඩෙප්පු යන ක්‍රම වලින් දෙකක් විස්තර කර ඇත්නම් (ල. 04)

(07) i. ප්‍රශ්නයට ගැලපෙන ලෙස ලබා දී ඇති පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 06)

ii. ♦ නූතන තාක්ෂණික මෙවලම් යොදාගෙන ඇති ආකාරය ♦ අතීතයේ යොදාගත් ක්‍රමශිල්ප. ♦ නූතනයට ගැලපෙන ලෙස ශ්‍රව්‍ය දෘෂ්‍ය කලාවන් යොදාගනු ලබන ආකාර පිළිබඳව විචාරාත්මකව උදාහරණ සහිතව ලබා දෙන පිළිතුර සඳහා (ල. 06)